# සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම් දිනය දීර්ඝ කිරීම

සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ දැනට පුරප්පාඩුව සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 07/2025 චක්‍ර ලේඛනය අනුව සුදුසුකම් සපුරා ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදිංචි අයදුම්කරුවන්ගෙන් විවෘතව අයදුම්පත් කැඳවීම 2026.08.21 වන දින දිනමිණ පුවත්පතේ පළවිය. එහි අවසන් දිනය 2026.09.18 වන දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

**සමිති අභ්‍යන්තර විගණක - III** යන තනතුර **අභ්‍යන්තර විගණක - III** තනතුර ලෙස සංශෝධන වේ.

**ගරු සභාපති,**
**සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**රිකිල්ලගස්කඩ.**
**දු.අ. 0812365580**
**2026.08.22**

